සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙන් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 6 ශ්‍රේණිය	**ක්‍රිස්තියානි ධර්මය - I**	කාලය / நேரம் / Time: පැය 02 යි.

නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: .....

උපදෙස් :

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

1) හිස්තැන් පුරවන්න.

(ගස් කොළන්, දෙවියන් වහන්සේ, මනහර, පොළොව, ජලය)

ඉන්පසු (i) ..... ගොඩබිම මතුවනු පිණිස අහස යට තිබෙන (ii) .....

එක තැනකට රැස් වේවා'යි වදාළ සේක. එසේම විය. ගොඩබිමට (iii). ..... කියා ද ජලයට සාගරය කියා ද නම් තැබූ සේක.

දෙවියන් වහන්සේ බීජ උපදවන ඇට සහිත ඵල දරන සියලු වර්ගවල (iv) ..... භූමියේ හට ගැනේවා'යි වදාළ සේක. ඒ සියල්ල (v) ..... බව උන්වහන්සේ දුටු සේක.

2) නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

(i) දේව මැවිල්ල (විනාශ/ ආරක්ෂා) කිරීම අප සැමදෙනාගෙම යුතුකමකි.

(ii) දෙවියන් වහන්සේ තම (ස්වරූපය / අදහස) අනුව මිනිසා මවා වදාළ සේක.

(iii) ජේසු බිළිඳා බැහැ දැකීමට (පළමුව / දෙවනුව) පැමිණියේ ශාස්ත්‍රවන්තයන් ය.

(iv) ජුදෙව්වන්ගේ ප්‍රධානතම මංගල්‍යය (අස්වනු නෙළීම / පාස්කු) මංගල්‍යය වේ.

(v) ජේසුතුමාගේ උත්ථානය (කාන්තාවන් / ශ්‍රාවකයන්) විසින් පළමුව දුටු සේක.

3) කෙටි පිළිතුරු ලියන්න.

(i) ජේසුතුමාගේ උත්ථානයෙන් පසුව එම්මාවුස් ගමට ගිය එක් ගෝලයෙකුගේ නම ලියන්න.

.....

(ii) දෙවියන් වහන්සේගේ කැමැත්තට පිටුපා ක්‍රියා කිරීම යනු කුමක්ද?

.....

(iii) ජෝර්දාන් ගං තෙර ළඟ දී මිනිසුන්ට දේශනා කළ වැදගත් පුද්ගලයාගේ නම කුමක්ද?

.....

(iv) පලස්තීනයේ ජීවත් වූ අන්‍ය ජාතිකයන් ලෙස සැලකූ ජනතාව හැඳින්වූ නම ලියන්න.

.....

(v) ශුද්ධාත්ම මග පෙන්වීම තුළ දේව වචනය ඉතියෝපීය ජාතිකයාට පහදා දුන්නේ කවුද?

.....

4) නිවැරදිව යා කරන්න.

(අ)	(ආ)
(i) කිතුණුවන් සතු විය යුතු වැදගත්ම ගුණාංගය කුමක්ද?	නාස්තිකාර පුතාට
(ii) අන්ධ බාර්තිමේයස්ට පෙනීම ලැබුණේ	නිහතමානී විය යුතු ය.
(iii) පසුතැවිලි වීමෙන් සමාව ලැබුණේ	ඔහු ජේසුතුමාව විශ්වාස කළ නිසා
(iv) අතීතයේ තිබූ ඉතා භයානක රෝගය නම්	ප්‍රේමය
(v) කිතුණු දරුවෙකු ලෙස අප නිතරම	ලාදුරු

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025

இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade } 6 ශ්‍රේණිය	**ක්‍රිස්තියානි ධර්මය - II**	කාලය / நேரம் / Time }

නම / பெயர் / Name } ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } .....

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1) ශුද්ධ බයිබලය ගැන ඔබ ඉගෙන ගෙන ඇති කරුණු පහක් ලියන්න.

2) දස පනතේ පනත් පහක් ලියන්න.

3) බයිබලයෙන් ඔබ ඉගෙන ගත් කුඩා කතන්දරයක් සම්පූර්ණයෙන්ම ලියන්න.

4) දාවිත් රජතුමා තුළ තිබූ යහපත් ගුණාංග පහක් ලියන්න.

5) මෝසෙස් තුමා කුඩා කලදී ආරක්ෂා වූ ආකාරය ඔහුගේ මව්පියන් සහෝදරයා සහෝදරියගේ නම් සඳහන් කරමින් විස්තරයක් ලියන්න.

6) දේව මාලිගාවේ කුඩා කල සිට හැදී වැඩුණේ කවුද? දෙවියන් වහන්සේ ඔහුට කතා කළේ කෙසේද?

7) ජේසුතුමා පරීක්ෂා තුන ජයගත් ආකාරය කෙටියෙන් ලියන්න.

8) ජේසුතුමා නිසා අපේ පාපවලට සමාවක් ලැබෙන නිසා උන්වහන්සේට ස්තුති කරමින් කෙටි යාච්ඤාවක් ලියන්න. (රෑල් 5ක්)

9) ඔබ තුළ ඇති දේව ගුණාංග පහක් ලියන්න.

10) මේ ලෝකය ආරක්ෂා කිරීමට කුඩා ඔබ කරන දේවල් දෙකක් ලියන්න.

11) ජේසුතුමා කල හාස්කම් දෙකක් ලියන්න.

12) ඔබ ඔබේ දෙමව්පියන්ට කීකරු වෙන ආකාර දෙකක් ලියන්න.